# The National Photographic Art Society of Sri Lanka

Approved Charity, Govt. Gaz. No. 442/20/87
Incorporated Company Reg. No. G.A. 300

Member : Federation Internationale de l'art Photographique (FIAP)
(International Federation of Photographic Art)
Photographic Society of America (PSA)

P.O. Box. 452, Colombo, Sri Lanka.
Office: 170, Kolonnawa Road, Dematagoda, Colombo 09, Sri Lanka.

Web : www.npassrilanka.org e-mail : npas@sltnet.lk facebook : TheNationalPhotographicArtSocietyofSriLanka


නිදහසට පෙර ශ්‍රී ලංකාවේ සෑම ක්ෂේත්‍රයකම පාහේ විදේශ ආධිපත්‍යය බල පැවැත් වුනි. නිදහසින් පසුව ද බොහෝ ක්ෂේත්‍ර ශ්‍රී ලංකිකයන්ට විවෘත නොවිණි. එවන් ක්ෂේත්‍රයක් වූ 'ඡායාරූප ශිල්පය' ලාංකික පොදු ජනතාව අතරට රැගෙන යාමේ පරමාර්ථයෙන්, 1950 මාර්තු මස 15 වන දින ප්‍රවීණ ඡායාරූප ශිල්පී විල්සන් හෑගොඩ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් **ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය** පිහිටුවිය. ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය නමින් ආරම්භ කරන ලද, **ද නැෂනල් ෆොටෝග්‍රැෆික් ආර්ට් සොසයිටි ඔෆ් ශ්‍රී ලංකා** ආයතනය දේශීයව සහ ජාත්‍යන්තරව ඡායාරූප ශිල්පයට කරන ලද සේවය වෙනුවෙන් **ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ *(International Federation of Photographic Art - FIAP)*** ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත ලෙස පත්කර ඇත. **ඇමරිකානු ඡායාරූප සංගමයේ *(Photographic Society of America - PSA)*** ද සාමාජිකත්වය ලබාගෙන ඇත. තවද ගෝලීය ඡායාරූප සංගමය ***(Global Photographic Union)*** හි ශ්‍රී ලංකීය මධ්‍යස්ථානය ලෙස කටයුතු කරයි.

රාජ්‍ය ආයතනයක් මගින් ඉටු කළයුතු ජාතික අවශ්‍යතාවයක් අප සංගමය මගින් ඉටුකිරීම හේතුවෙන් ශ්‍රී ලංකා රජය විසින් 1987 වර්ෂයේදී සංගමය පුණ්‍යායතනයක් බවට පත්කරන ලදී මීට අමතරව අප සංගමය **ද නැෂනල් ෆොටෝග්‍රැෆික් ආර්ට් සොසයිටි ඔෆ් ශ්‍රී ලංකා** නමින් ව්‍යවස්ථාපිත සංස්ථාවක් ද වන්නේය.

ඡායාරූප ශිල්පය කලා මාධ්‍යයක් ලෙස, සිංහල භාෂාවෙන් පොදු ජනතාව අතර ව්‍යාප්ත කිරීමේ භාර දූර කාර්යය සම්පූර්ණයෙන් නොමිලයේ සිදු කිරීම සංගමය පිහිටුවීමේ අරමුණ විය.

සංගමය මගින් සිදු කරන සේවාවන් කිහිපයක් පහත දැක්වේ.

- ඡායාරූප ශිල්පය පිළිබඳව තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් නොමිලයේ පවත්වාගෙන යාම හා වාර්ෂිකව විභාග පැවැත්වීම.
- ප්‍රයෝගික ඡායාරූප ගැනීමේ චාරිකා, වැඩමුළු, සම්මන්ත්‍රණ ආදිය පැවැත්වීම තුලින් ප්‍රවීනයන්ගේ දැනුම ආධුනිකයන්ට ලබා ගැනීමට අවස්ථාව උදාකර දීම.
- දේශිය හා ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශන සංවිධානය කිරීම මගින් ඡායාරූප කලාවේ පෝෂණයටත්, යහපත් විචාර කලාවක් ඇතිවීමටත් ඉඩ සැලසීම.
- ඡායාරූප ශිල්පය පිළිබඳ '**ලංකා කැමරා**' සඟරාව ඇතුළු ප්‍රකාශන නිකුත් කිරීම.
- සංගමයෙන් පිරිනැමෙන **ඇසුරු සාමාජිකත්වය *(ANPAS)*, සහාගි සාමාජිකත්වය *(FNPAS)* සහ ගරු සහාගි සාමාජිකත්වය *(Hon.FNPAS)*** යන සම්මාන පිරිනැමීම.
- ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනය මගින් පිරිනැමෙන ***AFIAP, EFIAP, ESFIAP, MFIAP*** සහ ***Hon.EFIAP*** සම්මාන ලබා ගැනීම සඳහා අවස්ථාව උදා කර ගැනීම.
- පාසල් සිසුන් සදහා ඡායාරූප ශිල්පය පළිබඳ ජාතික මට්ටමේ විභාගයක් පැවැත්වීම හා සහතික නිකුත් කිරීම

70 වසරක් පුරා ඡායාරූප ශිල්පය සඳහා මෙවන් උසස් සේවාවන් ලබා දෙන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන වෙනත් ආයතනයක් ශ්‍රී ලංකාව තුල නොමැත. අප සාමාජිකයන් ගේ කැපවීම මත පමනක් ම සාර්ථකත්වය කරා ගමන් කල ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය මතු පරපුර වෙනුවෙන් ආරක්‍ෂා කර ගැනීම සැමගේ යුතුකම වන්නේය.

**සාමාජිකත්වය සඳහා අයදුම් කිරීම**

**අයදුම්පත පිරවීම සඳහා උපදෙස්**

සාමාජික/සාමාජිකාවන්ගේ දත්ත ගබඩාකරගැනීමේ පහසුව සඳහා සාමාජික අයදුම්පත ඉංග්‍රීසි කැපිටල් අකුරු වලින් පමනක් පුරවන්න.

1. ජාතික හැඳුනුම්පතේ / විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් වන පරිදි සම්පූර්ණ නම. (එක් එක් නම අතර එක කොටුවක් ඉඩ තබන්න)

1.1 මුලකුරු සමග සම්පූර්ණ නම (මුලකුරු වල එක් එක් අකුර අතර එක කොටුවක ඉඩ තබන්න)

2. ස්ථිර ලිපිනය (තාවකාලික ලිපිනයන් සඳහන් කිරීමෙන් වලකින්න. ඔබට ලිපි එවිය යුතු තාවකාලික ලිපිනයක් ඇත්නම් අයදුම්පත්‍රයේ දෙවන පිටුවේ ඇති *Remarks* කොටුවෙහි එම ලිපිනය ලියන්න)

   විද්‍යුත් තැපැල් ලිපිනයන් හා දුරකථන අංක නිවැරදිව ඇතුලත් කරන්න.

**සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමග**

- ඇතුල්වීමේ ගාස්තුව රුපියල් 2000.00 ක් හා වාර්ෂික සාමාජික මුදල රුපියල් 1000.00 ක් වේ. මුළු මුදල රුපියල් 3000.00 ක් වේ.
- පාස්පෝට් ප්‍රමාණයේ (3.5 x 4.5) උඩුකය ඡායාරූප පිටපත් දෙකක් ලබාදිය යුතු අතර ඉන් එකක් අයදුම්පත්‍රයේ වෙන්කර ඇති ස්ථානයේ අලවන්න අනෙක් උඩුකය ඡායාරූපය අයදුම්පත සමඟ ලැබීමට සලස්වන්න.
- නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම් පත පහත ලිපිනයට ලැබීමට සලස්වන්න.
  විධායක අධ්‍යක්ෂ.
  ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය,
  170, කොලොන්නාව පාර, දෙමටගොඩ,
  කොළඹ 9.

**මුදල් ගෙවීම**

- **ඇතුලත්වීමේ හා සාමාජික ගාස්තු, අධ්‍යක්ෂ (මුදල්), ද නැෂනල් ෆොටෝග්‍රැෆික් ආර්ට් සොසයිටි ඔෆ් ශ්‍රී ලංකා** ආදායකයා ගේ නමට ලියා රේඛණය කරන ලද චෙක් පතක් මගින් හෝ
- **ලංකා බැංකුවේ බම්බලපිටිය ශාඛාවේ ජංගම ගිනුම් අංක** 717752 **ට ගෙවන ලද ලංකා බැංකුවේ මුදල් තැන්පතුවක් *(Cash Deposit)*/ මුදල් පැවරුමක් *(Cash Transfer)* මගින් ගෙවිය හැක. එහි මුල්පිටපත අයදුම්පත සමඟ එවන්න මුල්පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**සටහන**

- සම්පූර්ණ කරන ලද අයදුම්පත **දෙසැම්බර් 10** වන දිනට පෙර ලැබීමට සලස්වන්න. ඉන්පසු ලැබෙන අයදුම්පත්‍ර ඊලඟ වසර සඳහා සලකා බලනු ලැබේ.
- හඳුන්වාදීමට ඔබ දන්නා ජ්‍යේෂ්ඨ සාමාජිකයෙකු නොමැතිනම්, අයදුම්පත නිර්දේශය නොමැතිව ලැබීමට සලස්වන්න.